14 වන පිටෙන්

්මපාල අයියා බෙරය ගසයි. ගරායකා මිදුල මැද දන්නා තාල දමමින් නටයි. සියල්ලෝ ම තමාට හිමි තමාගේ කාර්යයන් ඉටු කරති. අපට තේරෙන ආකාරයට කවි කියා, දෙබස් කියා දැන් ගජරාමයට ගරායක් ශාන්තිය සිදු වේ.

මම දන්නා සියලු ම නැටුම් නටා හමාර කොට ගොරකා ගසට හෙවත් අයිලයට නැගුණෙමි. අයිලයේ ඉහළ ම ලීයට නැග දෙපසට කකුල් දමා ඒ මත වාඩි වී බෙරකරුවා සමඟ දෙබස් කියා අයිලය පදින්නට පටන් ගතිමි. දෙතුන් විටක් අයිලය පදින විට වියළි දර ලීයක් දෙකට මැදින් කැඩී මම බිම ඇද වැටුණෙමි. ඇද වැටීමෙන් තරමක වේදනාවක් ගෙන ආවද මා නැගිට්ටේ කිසිම වේදනාවක් නොදැනුණු අයෙකු ලෙස ය. දැන් දුම්මල ගැසීමේ වාරයයි. පන්දම වෙනුවට ගත් පොල් හනස්ස වමතට ගෙන ගුණපාල මල්ලී වළං කබලකට දමා ගෙන ආ වැලි දකුණතින් ගෙන සෑම පැත්තේ සිට පැමිණි බීරි උන්නැහේ මේ සන්ගෙඩිය කුමක් දැයි විපරම් නොකර ම කරත්තයට මා නංවාගෙන කරත්තය එක වටයෙන් හරවා බොරලින් අයියලාගේ නිවස දෙසට දැක්කුවේ වේගයෙනි. කරත්තයේ බෝන්ලීය උඩට පැන ගත් බීරි උන්නැහේ ගවයාගේ වලිගය ගෙන දෙකට නවා කටින් විකුවා මා බලාගෙන ය. කරත්තය කාරයක වේගයෙන් ඉදිරියට ඇදෙයි.

බොරලින් අයියලාගේ නිවසේ ඉස්තෝප්පුවේ වැල් ඇඳ උඩට මා ගෙන යාමට පිරිස පොරකති. වැල් ඇඳ උඩ වේදනාවෙන් කෙඳිරි ගාන මා දෙස බැලූ බොරලින් අයියා කකුලේ ලේ බේරෙන පෙදෙස අල්ලා ගෙන මැතිරුවේ හෙමිනි. එය ප්‍රථමාධාර මැතිරිල්ලයි. පසුව ගෙය තුළින් පීරිසියකට පොල් තෙල් දමා එයට කහ කැබැල්ලක් හීනියට ලියා දමා මැතිරීමට පටන් ගත් අතර තවත් අයෙක් මුරුංගා පොතු සමඟ තවත් මොනවදෝ කැලෑ කොළ කීපයක් ගෙනවිත් බොරලින් අයියා ළඟින් තැබුවේ ය. මතුරා බෙහෙත් බැන්ද බොරලින්

> **සිදුවුණු කතාන්දරය අසා සිටි ඩැනියල් ආතා නළලට අත තබා ගෙන බරපතල තත්ත්වයක් පෙන්නුම් කරමින් කීවේ, "මෙයින් බේරුණා ඇති හොඳ වෙලාවට බල්ල කාල නැවතුණේ. නැත්නම් ඕව පිස්සු හැදෙන වැඩ. ආවට ගියාට තොවිල්පවිල් වැඩ කරලා සාස්තරේ බාල්දු කරන්න හොඳ නෑ. ඊ ළඟට තනි වෙනව. යක්කු වැහෙන්න ගන්නවා. පිස්සු හැදෙනවා" කියායි.**

තැනකට ම දුම්මල ගැසුවෙමි. දුම්මල ගසමින් ගෙය ඇතුළත, පිට හැම තැනම වැලි විසි කෙරුවේ පන්දමට කෙළින් ය. දියෝනිස් බාස් උන්නැහෙලාගේ දවටගහගෙදර නිවසෙහි දෙවොල් මඩුවක දී ගරායකා ගෙදරට පමණක් නොව වටපිට ඇති හරක් මඩුවට, රොටි ඩයමන් ගසන මඩුවට ආදී සියලු ම ස්ථානවලට ද දුම්මල ගැසුවා මතක ය. මම ද කරුණාවතී පොඩි අම්මලාගේ නිවසට ද, ලිහිනිස් ආතාලාගේ ගෙදරට ද දුම්මල ගැසුවෙමි. ලිහිනිස් ආතලාගේ ගෙදර පිටුපස තිබුණු අතුමඩුවට ද දුම්මල ගැසුවෙමි. දුම්මල සඳහා භාවිතා කළ වැලි වැදීමෙන් එක විට ම එළියට පැමිණි "කඩියා" මා කලවයට පැන හැපුවේ කේන්තියෙනි. ''කඩියා'' අපගේ සුනඛ මිත්‍රයකු වුවත්, අප හුරතල් කරන සතෙකු වුවත්, කොළපතක් මුහුණට දමා ගෙන විකාර ඇඳුම් ඇඳ සිටි මා නොහඳුනන්නට ඇත. වෙස් මුහුණ මුහුණෙන් ගලවා විසි කළ මා කෑ ගසමින් නිවසට දිවීමට මහන්සි ගත්තත් වැඩිපුර දිවීමට නොහැකි ව ඇද වැටුණේ පොල්ගසක් මුලට ය.

''කඩියා'' මා ළඟට පැමිණ ඉව කර මා හඳුනාගෙන කෙඳිරිගාමින් ආපසු ගියේ කණගාටුවෙන් මට බැණබැණ විය යුතු ය. සෙ-්මපාල අයියා, ගුණපාල මල්ලි ඇතුළු පිරිස මා නිවසට ගෙන ගියේ ඔසවා ගෙන ය. කැඩී වැටුණු අයිලය මිදුල මැද ය. රොටි ඩයමන් ගැසීමට ගිය අම්මාත් තාත්තාත් නිවසට පැමිණියේ ඒ වේලාවේ ය. මා වට කර ගෙන සිටින පිරිස දුටුවිට අම්මා මහා හයියෙන් විලාප තියන්නට පටන් ගත්තා ය. තාත්තා පැමිණ මා කර තබා ගත්තේ බොරලින් අයියලාගේ ගෙදරට ගෙන යාමට ය. බොරලින් අයියා යනුවෙන් ගැමි පිරිස් ආමන්ත්‍රණය කරනු ලබන කොටපන්විල ප්‍රදේශයේ විසූ වයසක පුද්ගලයා සර්ප විෂට බෙහෙත් කරන අයෙකි. තාත්තා මා කරේ තබාගෙන යන විට ගල්කැටිය අයියා මුදල් පිළිබඳව විමසුවේ නැත. ''දත් හතරක් වැදිලා තියෙනවා. තව ටිකක් හරි උඩින් කෑව නම් කොලුවගෙන් වැඩක් නෑ" කියා පැවසූ විට සෑම දෙනා ම වාගේ හිනාවීමට පටන් ගෙන හිනාව නවතා ගත්තේ විනාඩි කීපයකින් ය.

හැන්දෑවේ ආරංචියට අපේ නිවසට ආවේ ඩැනියෙල් ආතා ය. ඩැනියෙල් ආතා යනු අපේ පළාතේ පුංචි පුංචි ගුරුකම් කරන, තෙල් මතුරන, නූල් බඳින අයෙකි. උණක්, සන්නියක්, හීතලක්, බඩේ අමාරුවක් හැදුණොත් ගමේ සියලු ම දෙනා සොයන්නේ ඩැනියල් ආතා ව ය. ඩැනියල් ආතා පණිවිඩය ලද විගසින් අවශ්‍ය තැනට වේගයෙන් යන්නේ මිට නැමුණු කළුපාට කුඩය කරේ එල්ලාගෙන ය. ඕනෑ ම තැනක නූලක් බැන්ද විට, තෙල් ටිකක් මැතුරූ විට නිවැසියෝ ඔහුට සත විසිපහක් හෝ සත පනහක් බුලත් කොළයක ඔතා දෙති. එය ඉතා සතුටින් බාර ගන්නා ඩැනියෙල් ආතා නිවසේ සියලු දෙනාට ම සෙත් කිරීමට සූදානම් කරගෙන ඇති වචන මාලාව කියවා මුදල සාක්කුවට දමා ගනියි.

සිදුවුණු කතාන්දරය අසා සිටි ඩැනියල් ආතා නළලට අත තබා ගෙන බරපතල තත්ත්වයක් පෙන්නුම් කරමින් කීවේ, ''මෙයින් බේරුණා ඇති හොඳ වෙලාවට බල්ල කාල නැවතුණේ. නැත්නම් ඕව පිස්සු හැදෙන වැඩ. ආවට ගියාට තොවිල්පවිල් වැඩ කරලා සාස්තරේ බාල්දු කරන්න හොඳ නෑ. ඊ ළඟට තනි වෙනව. යක්කු වැහෙන්න ගන්නවා. පිස්සු හැදෙනවා" කියායි.

ඩැනියෙල් ආතා මට කහ පාට නූලක් බැඳීමෙන් පසු අම්මා විසින් බුලත් කොළයක ඔතා දෙන ලද සත පනහ රැගෙන නිවසේ සැමට ම සෙත් පතා පිටත්ව ගියේ "ටිකක් හොඳට බලා ගත්තොත් හොඳා ළමයා තනි කරන්න එපා" කියමිනි.




# අඳුරින් වැසුණු ආරණ්‍ය සෙනසුනට දෙන්න ලබා ආලෝකය



**කාන්ති වික්‍රමසූරිය.**

අම්පාර ප්‍රසිද්ධ මාර්ගයේ බක්කි ඇල්ලට සැතපුම් දෙකක් සමීපව රජගල කන්දට සම්බන්ධව පිහිට කඳු වැටියට නැගෙනහිර බෑවුම, ඇසුරු කර ඇති සෙනසුන, ගල්තලා සහිත වන සතුන්ගෙන් ගහණ, දුටු ගැමුණු රජුගේ බිසව වූ 'රාජිතා' දේවිය විසින් අරඹන ලද බවද තපෝ භූමියක්ව පැවති කල රහතුන් බවුන් වැඩූ බවද, අවුරුදු දෙදහස් එකසියයට පමණ පෙර මූලාශ්‍ර කතාවේ ආරම්භ-යයි.

ලෙන් කුටි විසි හයක වැඩ සිටි රහතුන් අද මේ පුණ්‍ය භූමියේ නැතිවද, ගරා නොවැටී ප්‍රතිසංස්ක-රණය කල යුතු අවධියක පවතින්නේ නිති ආර-ක්ෂාව නිසා, අතීත ශ්‍රී විභූතිය විදහා පාන්නාක් මෙනි. කුටි අසල ඇති මනරම් කඳු පියසේ නිමවා ඇති බෝධිය, බුදු මැදුර ත්‍රස්ථ ප්‍රහාරයට ගොදුරු වුවද, අදටත් සිත් පහදවා ගැනීමට හැකි ලෙසින් දිස්වෙන්නේ තපෝ වනය ආලෝකමත් කරමිනි.

නිරන්තර කොටි නිජ භූමියක්ව පැවති පුළුකුණ ගම් පියස වල් අලි සතුන්ගේ ග්‍රහණයට හසු වුවද, හමුදා රැකවරණ මධ්‍යයේ කොටි ප්‍රහාරයෙන් දෙපා දුබල වුවද වාරු නොමැතිව අන් අයගේ පිළිසරණි න් ඇවිදිමින් නිති අනුශාසනා කරමින් ගම් වැසියන් රැක බලා ගන්නේ පූජ්‍ය අතිගරු ගල්ගමුවේ ශ්‍රී සුභූති හිමිපාණෝය.

අරන්තලා කෲර ඝාතනයේදී හමුදාව පොලිසිය සමග එක් රොක්ව තම ජීවිතය ගැන පවා නොතකා මරණාසන්න භික්ෂූන් වහන්සේලා අම්පාර රෝහල වෙත ගෙන යාමට උත්සුක වූයේද, උර දුන්නේද සුභූති හිමිපාණෝය.

ත්‍රස්ථ උවදුරු මැද වුවද රජගලතැන්න, නුගේලන්ද, බක්කි ඇල ගම්මානවල පොලිස් හමුදා ආරක්ෂාව සලසා යන එන මං නොමැතිව අතරමං වූ ජනතාවට හමුදා කඳවුරු බැඳ පාසැල් දරුවන්ගේ ආරක්ෂාව සලසමින් පියංගල ධර්ම ශාලාවේ පොලිසිය පිහිටුවා ගම්වැසියන්ට අධි ආරක්ෂාව ලබා දුන්නේ රට දැය රැකීමට වෙස් වළා පැමිණි ධර්ම දූතයා වූවේද ඔබයි ස්වාමීනි.

''දෙපා වාරු නැත සක්මන් කෙරුමට
හිතේ සවිය ඇත රට දැය රැකුමට''
වරෙක අවසන් මොහොතට පැමිණි සුභූති හිමියන්ගේ පණ නළ රැක දුනේනේ පියංගල සෙනසුනේ නොබිඳෙන භාස්කම් හා අසරණව දිවා රෑ උවටැන් කල ගම්මුන් නිසාවෙනැයි දැනුදු මට සිතේ.

වයසින් බාල වුවද සුභූති හිමියන්ට ඇප උපස්ථාන කරමින් අති දක්ෂ මෙහෙවරක යෙදෙන වව්නියාවේ සන්තින්ද්‍රිය ස්වාමීන් වහන්සේද සාමණේර පියංගල පිය සුමන හිමිද ආරන්‍ය සෙනසුනට මහගු සවියකි. පූජෝපහාරයකි. නොවැම්බර් මස 8 වන දින අළුයම කඨින පූජා පෙරහැර ගම් දනව් කරා පිය නැගුවේ දුබල වූ උවැසියන්ට නිවසටම ගොස් කඨින චීවරයට අත ගස්වා පින්කම ආලෝකමත් කර සිත් සතන් සනහුලූයේ වල් අලි භීතිය මැද වුවද හමුදා ආරක්ෂාව පෙරටු කොට ගනිමිනි. අති උත්කර්ෂවත්ව බාධක මැද වුවද පැවති කඨින පූජෝපහාරය එදින ගමටම ජීවය එළඹි දිනයකි.

සුභූති හිමිගේ මීලඟ අභිප්‍රාය වී ඇත්තේ නිම නොකල ධාතු මන්දිරය සකසා සර්වඥා ධාතූන් වහන්සේලා අසරණ ගම්වැසියන්ට වැඳ පුදා ගැනීමට සැලැස්වීමයි.



මේ උදාර මෙහෙවරට දෑස් දල්වා බලා සිටින හිමිවරුන්ගේද ගම්වැසියන්ගේ ද ප්‍රාර්ථනා ඉටු කරගැනීමට ඔබේ අත හිත දෙන්න. මේ සත්ක්‍රියාවට උර දෙන ඔබට රාජිතා දේවියගේද, වැඩ සිටින ස්වාමීන් වහන්සේලාගේද ආශිර්වාදය අනාගත පරපුර වෙනුවෙන් ලැබෙනු නොඅනුමානය. ධාතු මන්දිරය නිම කිරීමේ පුණ්‍ය ක්‍රියාවට හැකි පමණින් සහයෝගය දී හදවත් පුබුදුවා සිත් සතන් පහදවා ගන්න.

අඳුරින් වැසීගිය ගම් දනව්වකට යළි ජීවය ලබා දී සුභූති මිහිගේ නිර්මල ප්‍රාර්ථනා සඵල කිරීමට ඔබ සැමට ශක්තිය ධෛර්ය ලබේවා.......

**සුභූති හිමිගේ ලිපිනය**
ටී. සුභූති හිමි,
පියංගල ආරණ්‍ය සේනාසනය, පියංගල,
රජගලතැන්න.
**දුරකථන අංකය : 94 779172480**

**ගිණුම් අංකය :**
ටී. සුභූති හිමි -
**සම්පත් බැංකුව, අම්පාර. 106253133990**

